

## චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මා සම්බුද්ධ සාසනං

**ක්‍රි.පූ. 247 - 207කාලයේදී**

**දේවානම්පියතිස්ස රජතුමා විසින්**

**ගෞතම බුදුරජාණන් වහන්සේගේ**

**දක්ෂිණ අකු ධාතුන් වහන්සේ**

**තැන්පත් කොට කරවන ලද**

**ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ**

**ලක්දිවට බුදු දහම ලැබීමෙන් පසුව**

**ඉදිවූ පළමු සෑ රජුන්**

**ලෙස බුහුමනට පාත්‍ර වේ.**





## ථූපාරාම චෛත්‍යාරාමාධිකාරී හිමියන්ගේ පණිවුඩය

අනුරාධපුර ඓතිහාසික අටමස්ථාන අතුරෙන් ථූපාරාමය ඉපැරණිම සිද්ධස්ථානය ලෙසින් ද බුදු දහම ලැබීමත් සමග ලක් පොළව මත ඉදිවූ පළමු ස්තූපය ලෙසින් ද බුහුමනට පාත්‍ර වෙයි. ක්‍රි. පූ. 247-207 අතර කාලයෙහි ලක්දිව සිහසුන හෙබවූ දේවානම්පියතිස්ස මහ රජතුමා විසින් මහින්ද මහ රහතන් වහන්සේගේ පූර්ණ මගපෙන්වීම මත ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකරවන ලදි. පශ්චාත් කාලීනව ස්ථූපය මුල් කොටගෙන සකලාංගයන්ගෙන් පරිපූර්ණ ආරාමයක් බවට පත්වූ මෙම පුදබිම ථූපය ඇසුරින් ඉදිවූ ආරාමය යන අර්ථයෙන් ථූපාරාමය වූ බව පැහැදිලිය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් ශේෂ වූ ධාතූන් වහන්සේලා අතුරින් දකුණු ශ්‍රී අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට වත්මන බසවක්කුලම නමින් හැඳින්වෙන එකල අබා හෙවත් අභය නමින් ව්‍යවහාර වූ වැවෙන් මැටි ගෙනවුත් ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකරවූ බව ඉතිහාසය සාක්ෂි දරයි. එසේම කකුසඳ, කෝනාගම, කාශ්‍යප යන බුදු රජාණන් වහන්සේලාගේ ඬබරා ධාතුව, පටි ධාතුව, ජලසාටිකාව ආදී පාරිභෝගික ධාතූන් වහන්සේලා ද මෙහි ම නිධන් කොට ඇති අතර එම සියලුම බුදුවරයන්ගේ ස්පර්ශයෙන් පවිත්‍රත්වයට පත් පූජනීය ස්ථානයකි ථූපාරාමය.

දශක කිහිපයක පටන් නිසි සංවර්ධනයක හීනතාවයෙන් යුතුව පැවති මෙම ඓතිහාසික ථූපාරාම පුදබිම නැවත ක්‍රමවත් වැඩපිළිවෙක් යටතේ එහි පූජනීයත්වයත් ගෞරවණීයත්වයත් සුරැකෙන අයුරින්

සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙල මේ වන විට ආරම්භ කොට ඇති අතර මෙම කුඩා පුස්තකය ද එකී සංවර්ධන ක්‍රියාවලියෙහි මූලික අදියරට අයත් වූවක් සේම කාලයක සිට ථූපාරාමය වන්දනා කිරීමට පැමිණෙන බැතිමතුන් විසින් කරනු ලබන ඉල්ලීමක ප්‍රතිඵලයකි.

ලක්දිව ඉපැරණිම චෛත්‍යස්ථානය වුව ද ථූපාරාමයේ ඓතිහාසික පසුබිම පිළිබඳ නිවැරදි අවබෝධයකින් යුක්ත පිරිස ඉතාම අල්ප බවත් එකී අනවබෝධයෙන් ම අතැමුන් අදහස් කරනුයේ 'අකු ධාතුව' යනු 'හකු ඇටය' බවත් මෙහිලා සඳහන් කළ යුතුය. 'අකු ධාතුව' නම් බුදු රජාණන් වහන්සේගේ උරහිස් අස්ථිය යි. එම වැරදි අවබෝධය උච්චාරණයත් සමග හැඟීයන දෙයක් මිස අනෙකක් නොවන බව අපගේ අදහසයි. ථූපාරාම දාගැබ වටා ඇති ඉපැරණි ඉදිකිරීම් සමූහයක නශ්ටාවශේෂ අදටත් දැකිය හැකි අතර එකී තොරතුරු ද මෙහි අන්තර්ගත ය.

ථූපාරාම පුදබිම පිළිබඳව සැදැහැති පාඨක ජනයාට ප්‍රාමාණික දැනීමක් ලබා දෙනු වස් මෙම පුස්තකය සකස් කිරීමේදී උපකාර කළ සැමට කෘතඥ වෙමි. අප ගුරුදේවෝත්තමයන් වහන්සේලා වන අනුරාධපුර අටමස්ථානාධිපති උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය ආචාර්‍ය අතිගරු පල්ලේගම සිරිනිවාස නායක මාහිමිපාණන් වහන්සේ ද, රුවන්වැලි මහ සෑ චෛත්‍යාරාමාධිකාරී නුවර කලාවියේ ප්‍රධාන සංඝනායක අතිගරු පූජ්‍ය පල්ලේගම හේමරතන නායක හිමිපාණන් වහන්සේ ද ගෞරවයෙන් සිහිපත් කරමි.

තෙරුවන් සරණයි

ථූපාරාම චෛත්‍යාරාමාධිකාරී
**ශාස්ත්‍රපති පූජ්‍ය කහල්ලේ ඤාණින්ද ස්ථවිර**



ථූපාරාම ස්තූපය 1896 දී (ඡායාරූපය ජේ.ජී. ස්මිතර් මහතා



ඓතිහාසික අනුරාධපුර අටමස්ථානය, ලෝකවාසී බෞද්ධ මෙන්ම අබෞද්ධ ජනතාවගේ ද සුවිශේෂී ගෞරවාදරයට පත් පූජනීයම සිද්ධස්ථාන අටකි. දෛනිකව දහස් ගණනක් දෙස් විදෙස් සැදැහැති පිංවතුන් මෙන්ම සංචාරකයින්ගේ නෙත ගැටෙන මෙකී ස්ථාන අට පිළිබඳ තොරතුරු මහාවංශය, දීපවංශය, ථූපවංශය, බෝධිවංශය ආදී වංශකතා සාහිත්‍යයෙහිද තත්කාලීනව බිහි වූ නොයෙක් සාහිත්‍ය කෘතීන්හි ද ඉමහත් පූජනීයත්වයෙන් යුතුව සඳහන් කොට ඇත. මුලින්ම අටමස්ථානය ලෙස සලකන ලද්දේ බුදු දහම හඳුන්වා දීමෙන් අනතුරුව මිහිඳු හිමියන් විසින් මහා විහාර සීමාව සලකුණු කරනු වස් ඉසින ලද මල් පතිත වූ ස්ථාන හත සහ දේවානම්පියතිස්ස රජු විසින් මහමෙව්නා උයන පූජා කිරීමේදී අතපැන් වත්කළ ස්ථානයත් ය. එම ස්ථාන මෙලෙස ය.

- මහමෙව්නා උයන
- ශ්‍රී මහා බෝධිය පිහිටුවන ස්ථානය
- ලෝවාමහාපාය
- ලහබත් ගෙය
- ජන්තාගාර පොකුණ
- කම්ම මාලකය
- චතුෂ්ශාලාව
- රත්නමාලී චෛත්‍ය භූමිය

මේ අතුරෙන් කම්ම මාලකය පිහිටි ස්ථානයේ පසු කලෙක දුටුගැමුණු මහ රජතුමාගේ දේහය ආදාහනය කොට දක්ෂිණ ස්ථූපය ඉදිකරවා ඇති අතර අනෙක් ස්ථාන සියල්ල ම මහමෙව්නා උයනේ අදටත් විද්‍යමානය. මෙම සිද්ධස්ථාන අට පූජනීය අටමස්ථානය වශයෙන් පිළිගැණුන ද කලින් කලට එම ස්ථාන පිළිබඳ වූ අදහස වෙනස් වූ බව පූජාවලිය, සද්ධර්මරත්නාකරය ආදී කෘතීන්හි සඳහන්ව ඇති තොරතුරු පිරික්සීමේදී පෙනී යයි. එහෙත් එම ස්ථාන අනුරාධපුරයෙන් පිටතට නොගිය බව ද පැහැදිලිය. වත්මන් අටමස්ථානය ලෙස පිළිගැනෙන පූජනීය සිද්ධස්ථාන අට එලෙස පිළිගැනීම නිල වශයෙන් සිදුවූයේ 1909 ජනවාරි 19 වන දින මැකලම් ආණ්ඩුකාරවරයා ප්‍රධාන බ්‍රිතාන්‍ය පාලකයන් සහ අටමස්ථාන කාරක සභාව අනුරාධපුර කච්චේරියේදී කරන ලද සාකාච්ඡාවකදීය. එලෙස සම්මත කරගන්නට යෙදුන අටමස්ථාන පහත පරිදි ය.

- ශ්‍රී මහා බෝධිය
- රුවන්වැලි මහා සෑය
- ථූපාරාමය
- මිරිසවැටිය
- ලෝවාමහාප්‍රාසාදය
- ලංකාරාමය
- අභයගිරිය
- ජේතවනාරාමය

මෙම පූජනීය ස්ථාන අට අටක් නොව එකක් වශයෙන් ම බැඳී පවතින හෙයින් ථූපාරාමය පිළිබඳව කෙරෙන සාකච්ඡාවට මත්තෙන් අනෙකුත් සිද්ධස්ථාන කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත්ය.

# ශ්‍රී මහා බෝධිය



ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු බෝධි වන්දනාවේ ඇරඹුම සනිටුහන් කරමින් ශ්‍රී මහා බොධින් වහන්සේ මෙරටට වැඩමවීය. ක්‍රි.පූ. 246 දී දේවානම්පියතිස්ස රජු දවස, ගිහිකල ඥාතීත්වයට මිහිඳු මහ රහතන් වහන්සේගේ නැගණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය සමග වඩමවන්නට යෙදුණ අප මහා බෝසතාණන් වහන්සේට සම්බුද්ධත්වය පිණිස මහෝපකාරී වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව අද අප සැමගේ ගෞරවාදරයට පත්වන අනුරපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේය. දේවානම්පියතිස්ස රජු විසින් මහමෙව්නා උයනෙහි මිහිඳු මාහිමියන් විසින් පෙන්වන ලද ස්ථානයෙහි ඉමහත් උත්සව ශ්‍රීයෙන් බෝධි අංකුරය රෝපණය කරන ලදි. බෝධීන් වහන්සේ පිහිටි තැන බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත්වූ ශුද්ධ භූමියක් බව මහාවංශයෙහි ද සඳහන් ය.

බොධීන් වහන්සේ පොළෝ මට්ටමේ සිට අඩි 21 ක් ඉහළින් වූ වේදිකාවක් මත පිහිටුවා ඇති අතර එම වේදිකාව මට්ටම් තුනකින්

සමන්විතය. වේදිකාවේ දිග අඩි 71 ක් වන අතර පළල අඩි 57 ක් වේ. පොළෝ මට්ටමේ පිහිටි පළමු මාලකය වැලිමළුව නම් වෙයි. එහි බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය සංකේතවත් කරමින් රෝපණය කරන ලද බෝධීන් වහන්සේලා 41 ක් ඇති අතර මෙම පරිවාර බෝධීන් වහන්සේලා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට පිහිටුවන ලද ඒවාය. බෝධීන් වහන්සේ හා බැඳුණු ඉපැරණි චාරිත්‍ර සමූහයකි. අදටත් එම චාරිත්‍ර ඒ අයුරින් ම පවත්වගෙන යන අතර සුවිශේෂී ආරක්ෂාවක් ද සපයනු ලබයි. සියවස් විසි දෙකකට අධික ඉතිහාසයකට හිමිකම් කියන මෙම පූජනීය ස්ථානය මෙම සියවස් ගණන මුළුල්ලේ ම ආරක්ෂිතව පැවතිය ද 1929 ජූලි මස 30 වන දින එක්තරා පාපී පුද්ගලයෙකුගේ උමතු ක්‍රියාවක් නිසා බෝධීන් වහන්සේගේ එක් ශාඛාවකට හානි සිදු වූ අතර එයින් මුළු මහත් ලෝකවාසී බෞද්ධ ජනයාම කම්පා විය.

## මිරිසවැටිය



ක්‍රි.පූ. 161-137 කාලය අතරතුර ලක්දිව රාජ්‍ය විචාළ දුටුගැමුණු මහ රජතුමා විසින් ඉදිකරවන ලද පළමු චෛත්‍යය මිරිසවැටි ස්තූපයයි. සර්වඥ ධාතුන් වහන්සේලා ද රජතුමාගේ ජයකුන්තය ද නිධන් කොට

බුබ්බුලාකාර හැඩයෙන් ඉදිකරවන ලද මෙම ස්තූපය වරින් වර නොයෙක් රජ දරුවන්ගේ ප්‍රතිසංස්කරණයන්ට ලක් වූ අතර අවසන් වරට අද අපට දක්නට ඇති චෛත්‍යය ප්‍රතිසංස්කරණ කටයුතු නිමවා 1993 ජුනි මස 04 වන පොසොන් පොහෝ දින උත්සවාකාරයෙන් නිරාවරණය කරන ලදී. එහි උස අඩි 192 ක් වන අතර විශ්කම්භය අඩි 141 කි. මෙම දාගැබ ඉදිකිරීම හා බැඳුණු මහාවංශය සාක්ෂි දරණ කතා පුවත ද මනස්කාන්තය.

දුටුගැමුණු රජතුමාගේ ජයකුන්තය සර්වඥ ධාතූන් වහන්සේලා ද සහිතව නිමැවූ එකකි. එළාර රජු හා කරන ලද යුද්ධයෙන් ජය ලබා ලක්දිව නැවත එක්සේසත් කිරීමෙන් අනතුරුව දිනක් රජු තම ජයකුන්තය මෙම ස්ථානයෙහි සිටුවා ජලස්නානය පිණිස තිසා වැවට ගියේය. ස්නානය කොට නැවත පැමිණි රජු ජයකුන්තය ගැලවීමට නොයෙක් අයුරින් උත්සාහ ගත්ත ද එය සෙලවීමටවත් නොහැකි විය. අනතුරුව එය මැදි කොට මෙම මිරිසවැටි දාගැබ ඉදිකරවූ බව සඳහන්ය. වසර තුනකින් පමණ මෙම දාගැබෙහි වැඩ නිම කොට ඇත. ථූපවංශය සඳහන් කරන ආකාරයට දුටුගැමුණු රජු විසින් සංඝයාට නොපිළිගන්වා මිරිස් මාළුවක් අනුභව කිරීමත් එය පියරජතුමන්ට වූ පොරොන්දුවක් කඩ කිරීමක් වූ බැවින් මෙම මිරිසවැටි දාගැබ සාදවා පූජා කළ බව විස්තර වෙයි.

## ලෝවාමහාපාය



ලෝවාමහාපාය භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පිණිස කරවන ලද මහල් නවයකින් පමණ සමන්විතව තිබූ සංඝාවාසයක් මෙන් ම භික්ෂූන්ගේ උපෝසථාගාරයක් ලෙස හඳුනාගෙන ඇත. මිරිසවැටි දාගැබ ගොඩනැංවීමෙන් අනතුරුව දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද මෙය ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය සංඛේතවත් කරන තවත් එක ඉදිකිරීමකි.

දිගින්, පළලින් හා උසින් සමානව මෙය රියන් දහස බැගින් වූ බව ද එක් මහලක කාමර 100 බැගින් තිබූ බව මහාවංශය සඳහන් කරයි. පබළු හා මැණික්වලින් අලංකාර කොට තිබූ මෙහි වහළය තඹ ලෝහයෙන් සෙවිලි කර තිබී ඇති අතර එබැවින්ම මෙම ගොඩනැගිල්ල ලෝවාමහාපාය යන නමින් හඳුනවා ඇති බව ද කියවේ.

ක්‍රි.ව. 275-301 කාලය අතරතුර රාජ්‍යය කළ මහසෙන් රජු විසින් විනාශ කරන ලද මහා විහාරාශ්‍රමයන් අතරට ලෝවාමහාපාය ද ඇතුළු වූ අතර රජු විසින් මෙය සම්පූර්ණ වශයෙන්ම බිමට සමතලා කොට නගුලින් සාවා උඳු වැපිරවීය. ඔහුගේ ඇවෑමෙන් රාජ්‍යත්වයට පත් සිරිමේඝවර්ණ රජු විසින් මෙය නැවත ගොඩනැංවූ අතර වරින් වර රාජ්‍ය අනුග්‍රහය ලද ලෝවාමහාප්‍රාසාදයෙහි අද වන විට ගල්කණු 1600 ක් පමණ ඉතිරිව ඇත. අටමස්ථානයට අයත් අනෙක් සිද්ධස්ථාන හා සසඳන කල ලෝවාමහපාය වන්දනාමාන කරන සිද්ධස්ථානයක් ලෙසින් ම බුහුමනට පාත්‍ර නොවුන ද මෙහි ඇති අද්විතීය ඓතිහාසිකත්වය හා ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය අවචාය ය. වත්මන මෙම ස්ථානය මධ්‍යයෙහි ඉදිකොට ඇති ගොඩනැගිල්ල මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා විනය කර්ම කිරීම උදෙසා භාවිත කරනු ලබන පොහොය ගෙයයි.

# රුවන්වැලි මහා සෑය



මහා සෑය නමින් බෞද්ධ ජනයා අතර ප්‍රකට ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතුන් වහන්සේලා වැඩ සිටින පූජනීය ම චෛත්‍ය රාජයාණන් වහන්සේ රුවන්වැලි මහා සෑයයි. ලාංකේය ඉතිහාසයේ නර ශ්‍රේෂ්ඨයා ලෙස සැලකෙන දුටුගැමුණු මහ රජතුමා විසින් ක්‍රි.පූ. 137 දී කරවන ලද මෙය බුබුබුලාකාර හැඩයෙන් යුක්තවන අතර ශ්‍රී මහා බෝධිය හැරුණු කොට අටමස්ථාන අතර බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන අනුරාධපුරයේ පිහිටි අනෙක් ප්‍රධානත ම ස්ථානය රුවන්වැලි මහා සෑයයි. සම්පූර්ණයෙන්ම වැඩ නිමවීමට මත්තෙන් දුටුගැමුණු රජුගේ අභාවය සිදු වූයෙන් අනතුරුව රාජ්‍යත්වයට පත් රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජු විසින් රුවැන්වැලි මහා සෑයේ ඉදිකිරීම් කටයුතු නිම කරවන ලදි.

වරින් වර ගරා වැටී නැවත ගොඩනංවන ලද මෙම සුවිසල් ස්තූපය අවසන් වරට ප්‍රතිසංස්කරණය කොට කොත් වහන්සේ පළඳවා

නිරාවරණය කරන ලද්දේ 1940 ජුනි මස 19 වන දිනය. රුවන්වැලිසෑයේ වත්මන් උස අඩි 350 ක් වන අතර විශ්කම්භය අඩි 300 කි.

මහා සෑය පිළිබඳ දීර්ඝ විස්තරයක් මහාවංශය හා ථූපවංශය ඉදිරිපත් කරන අතර අනාගතයේ සම්බුදු සසුන අවසන් වන විට ගෞතම බුදු රජාණන් වහන්සේගේ සියලුම ධාතූන් වහන්සේලා එක තැනකට එක්ව පිරිනිවන්පාන බවත් එම ස්ථානය රුවන්වැලි මහා සෑය බවත් සුමංගලවිලාසිනී හා පපඤ්චසූදනී අට්ඨකතාවන්හි සඳහන්ය.

## ලංකාරාමය



ලංකාරාමය, අභයගිරියට නිරිත දෙසින් පිහිටා ඇත. මෙය ක්‍රි.පූ. පළමුවන සියවසේදී රජකළ වළගම්බා රජු විසින් කරවන ලද්දකි. ථූපාරාම දාගැබ මෙන් ගල්කණු මත ඉදිකරන ලද පියස්සක් ද සහිතව තිබූ මෙම චෛත්‍යය ප්‍රමුඛ ආරාමය අතීතයේ මණිසෝමාරාමය යන නමින් ද හඳුන්වා ඇත. දාගැබ වටා පේළි තුනකින් සමන්විත ශෛලමය කුළුණු පිහිටා ඇති අතර දැනට ගල්කණු 34 ක් පමණ දක්නට ඇත. කුළුණු හිස් ථූපාරාමයේ ගල් කුළුණුහිස් හා සමානවන අතර චෛත්‍යයට ප්‍රවේශ වීමට පියගැට පෙළ හතරක් ඇත.

ථූපාරාමයට වඩා කුඩා මෙම චෛත්‍යයේ වත්මන් විශ්කම්භය අඩි 38 ක් වන අතර පොළෝ මට්ටමේ සිට අඩි 10 ක් පමණ උසින් පිහිටා ඇති අඩි 132 ක් වන වෘත්තාකාර වේදිකාවක් මත පිහිටා ඇත. අනෙක් සිද්ධස්ථාන හා සසඳන කළ වංශකතාවන්හි අඩුවෙන්ම තොරතුරු දැක්වෙන ලංකාරාමය පිළිබඳව දීර්ඝ විස්තරයක් සොයා ගැනීම අසීරුය.

## අභයගිරිය



දමිළයන් සමග සටනින් පැරදී පළායන වළගම්බා රජුට උසුළු විසුළු කළ ගිරි නම් නිගණ්ඨයාගේ ආශ්‍රමය නැවත රජකම ලබා ගැනීමෙන් පසුව බිමට සමතලා කොට ක්‍රි.පූ. 109 හා 89-77 අතර කාලය අතරතුර ලක්දිව සිහසුන හෙබවූ වළගම්බා රජු විසින් ඉදිකරවන ලද දාගැබ අභයගිරි දාගැබයි. සුවිශාල සලපතළ මළුවක් මත ඉදිකර ඇති මෙහි විශ්කම්භය අඩි 355 ක් වන අතර උස අඩි 245 පමණ වෙයි.

අභයගිරි දාගැබෙහි නිධන් කර ඇත්තේ කුමන ධාතූන් දැයි නිශ්චිත තොරතුරක් පිළිබඳව වංශකතාවන්හි සඳහනක් දක්නට නොමැති නමුදු අප ගෞතම බුදු රජාණන් වහන්සේගේ පාරිභෝගික ධාතූන් අතුරෙන් පාත්‍රා ධාතුව නිධන් කොට ඇති බව ඉපැරණි විශ්වාසයයි. අක්කර 600 ක පමණ භූමි භාගයක් පුරා විහිදී පවතින මෙම

පුදබිම පරිපූර්ණ ආරාම සංකීර්ණයක්ව පැවත ඇත. අදටත් එකී විශාල ආරාම සංකීර්ණයේ නටඹුන් දාගැබ වටා දැකිය හැක. ලක්දිවට වැඩි බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටි තවත් එක ස්ථානයක් ලෙස සැලකෙන මෙය ගඩොලින් ම නිම කරන ලද්දකි. අනුරාධපුරයේ අනෙකුත් සිද්ධස්ථාන මෙන්ම අභයගිරි දාගැබ ද පසුගිය සියවස් ගණනක කාලය තුළ වල් බිහිවී තිබූ අතර 1940 දී පමණ නැවත ප්‍රතිසංකරණ කටයුතු ආරම්භ කොට සංරක්ෂණය කරන ලද්දකි.

## ජේතවනාරාමය



ජේතවනාරාමය මහා විහාරයට අයත් ජෝති නම් වන උද්‍යානයෙහි මහසෙන් රජතුමා විසින් 276-313 අතර කාලය තුළ ඉදිකරන ලද අටමස්ථානයට අයත් තවත් එක් සුවිශාල දාගැබකි. මෙහි නිදන් කොට ඇති වස්තූන් පිළිබඳව ද දීර්ඝ විස්තරයක් වංශකතා සාහිත්‍යයෙහි පිළිබිඹු නොවුන ද ගෞතම බුදු රජාණන් වහන්සේ විසින් පරිහරණය කරන ලද පටි ධාතුව ධාතු ගර්භයෙහි තැන්පත්ව ඇති බව අප සැමගේ ගෞරවණීය විශ්වාසයයි. මහා විහාරීය භික්ෂූන්ට එරෙහිව සාගලික නම්

භික්ෂු නිකායක් ආරම්භ වීම මෙම විහාරාරාමය ඉදිකිරීමට මූලිකම සාධකය වූ බව ප්‍රකට කරුණකි. අනුරාධපුරය තුළ බිහිවූ චෛත්‍යය රාජයාණන් වහන්සේලා අතර ඇති සුවිශාලම දාගැබ මෙය වන අතර ආරම්භයේදී මෙය උසින් අඩි 400 ක් පමණ බව වාර්තා වේ. එහෙත් මෙහි වත්මන් උස අඩි 231 ක් වෙයි. ලොව පැරණි ඉදිකිරීම් අතර මෙය උසින් දෙවැනි වන්නේ ඊජිප්තු පිරමීඩවලට පමණක් බව ඇතමුන්ගේ මතයයි.

දාගැබ් මළුව අක්කර 7 ක් පමණ වන අතර අනුරාධපුරයෙහි පිහිටි අනෙක් මහා සෑයන් දෙකෙහි මෙන්ම මෙහි ද චෛත්‍යය වටා ඇත් පවුරක් තනවා තිබී ඇත. සොලී ආක්‍රමණයේදී ජේතවනාරාමය ද විනාශ කොට ඇති අතර එය නැවත පරාක්‍රමබාහු රජ සමයේදී අඩි 210 ක් උසට තනවා ඇති බව වංශකතාවන්හි සඳහන්ය. නොයෙක් අවස්ථාවන්හි වල් බිහි වී ගරාවැටී තිබූ මෙම දාගැබ 1950 වසරේදී පමණ නැවත ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කොට අද දක්නට ඇති තත්වයට පත්කොට ඇත.

# ථූපාරාමය



අනුරාධපුර අටමස්ථාන අතුරෙන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේත් රුවන්වැලි මහා සෑයත් හැරුණකොට සැදැහැවතුන්ගේ පූජනීයත්වයට පත්වන මීළඟ සිද්ධස්ථානය ලෙසට ථූපාරාම පුදු බිම නම් කළ හැක. මෙම සිද්ධස්ථාන තුන ම පයින් ඇවිද යා හැකි දුරකින් සමීපයෙහි පිහිටා තිබීම ද විශේෂත්වයකි.

තෙවන ධර්ම සංගායනාවත් සමග ඇරඹි නවරට ධර්මදූත සේවාවේ උත්තරීතර දායාදයක් ලෙස ලක්දිවට ලැබුණු මහර්ග වස්තුවක් වන සම්බුද්ධ දර්ශනය ද ඒ හා බැඳුණු අනේක ප්‍රකාර වූ සංස්කෘතික දායාදයන් ද බොහෝය. වංශකතාකරුවන් සාක්ෂ්‍ය ගෙනහැර දක්වන ආකාරයට සංඝමිත්තා තෙරණියත් සමග ලක්දිවට වැඩමවන්නට යෙදුණ

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ද ඒ සමග පැමිණි දහඅට කුලයක මානව සම්පත ද ලක්දිව ඇතිකළ අභිවෘද්ධිය ශ්‍රෙෂ්ඨ ජාතියක අභිමානය ලොවට ම ගෙන ගිය බව කිව මනාය. අපගේ සාකච්ඡාවෙහි වස්තු බීජය වන ථූපාරාමය, ගෘහ නිර්මාණ ශිල්පය හා බැඳුණු විශිෂ්ඨත්වය හා ශාසනය හා බැඳුණු පූජනීය උරුමයක් මෙන්ම බුදු දහම ලැබීමෙන් පසු ලක්දිව ඉදිවූ පළමුවන චෛත්‍යය ලෙසද ඉතිහාසයට එක්වෙයි. දිවයින පුරා විහිද පවතින වෙහෙර වහන්සේලා අතර ශාසනික අත්‍යාලංකාරය විදහා දක්වන ඉපැරණි චෛත්‍ය ගෘහයක නෂ්ටාවශේෂ වූ ගල් කුළුණු රැසකින්ද ආරක්ෂිත ථූපාරාම සෑ රදුන් මතුවටත් විශේෂ්‍ය කාරණයෙන් බුහුමනට පාත්‍ර වේ.

අප ගෞතම තථාගතයන් වහන්සේගේ පිරිනිවීමෙන් ශේෂ වූ ධාතූන් වහන්සෙලා අතුරෙන් දකුණු අකු ධාතූන් වහන්සේ සහ තවත් සර්වඥ ධාතූන් වහන්සේලා නිධන් කොට ක්‍රි.පූ. 246 දී ඉල් මස පුර පසළොස්වක පොහෝ දිනෙක ලක් පොළොවට මාණික්‍යයක් පරිද්දෙන් දෙවන පෑතිස් රජු විසින් සාදවා පූජා කරන ලද ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේත් එකී ආරාම සංකීර්ණයත් පිළිබඳ වංශකතාකරුවන් ගෙනහැර දක්වන ඉතිහාස කතා පුවත සහ ධාතු නිධානෝත්සවය හා බැඳුණු අතීත සිද්ධීන් ඉතා පුණ්‍යවන්තය.

පොසොන් පුර පසළොස්වක පොහෝ දින ලංක්දිවට වැඩම වූ මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන මහ සඟ රුවන සෑගිරියෙහි වස් වසා වැඩ හිඳ වප් පොහෝ දින පවාරණයෙන් පසුව රජගෙට වැඩම කොට දන් වළඳා අවසන දෙවනපෑතිස් රජු අමතා "මහරජ අප බොහෝ කලකින් තථාගතයන් වහන්සේ නොදැක ඉන් අසරණව වාසය කරන්නෙමු" යි කීහ. එකවර උනවහන්සේ පැවසූ දෙය නො වැටහුණු රජු "කුමක් පවසන්නෙහිද හිමියනි තථාගත පරිනිර්වාණය සිදු වූ බව නුඹ වහන්සේ ම කලින් පැවසුවා නොවේද" යැයි විමසීය. එයට පිළිවදන් දුන් මිහිඳු හිමියෝ එය සත්‍යයකි මහරජතුමනි උන්වහන්සේ ඒකාන්තයෙන් ම පිරිනිවී වැඩි බවත් එහෙත් උන්වහන්සේගේ ශරීරයෙන් ශේෂ වූ ධාතූන්

වහන්සේලා නිරුපද්‍රිතව වැඩ හිඳින හෙයින් ධාතූන් වහන්සේ දැකීම බුදුන් දැකීමක් හා සමාන වන බව ද පැවසීය. එබස් ඇසූ රජතුමා එසේ නම් ස්වාමීනි ධාතූන් වහන්සේලා ලබා දුන මැනව මා විසින් ස්තූපයක් කරන්නෙමි යැයි පැවසීය.

ඉණික්බිතිව මිහිඳු හිමියෝ සුමන සාමණේරයන් අමතා රජතුමා අතර සිදුවූ සාකච්ඡාව තුළින් මතුවූ කාරණය සැළකර උන්වහන්සේගේ ගිහිකල ඤාතීත්වයට අනුව මුත්තණුවන් වන ධර්මාශෝක රජු හා දෙව්ලොව වසන ශක්‍රයා වෙතින් ධාතූන් වහන්සේලා වැඩමවාගෙන එන ලෙසට දැන්වූහ. සුමන සාමණේරයන් වහන්සේ ද එකී උපදෙස් අනුව යමින් දඹදිවට වැඩම කොට ධර්මාශෝක රජතුමාට තමන් වහන්සේ පැමිණි හේතුව පැවසීය. අනතුරුව රජතුමා බුදු රජාණන් වහන්සේ දන් වැළඳූ පාත්‍රය පුරවා සර්වඥ ධාතූන් වහනසේලා පිළිගැන්වූ අතර සුමන සාමණේරයන් වහන්සේ එම සර්වඥ ධාතූන් වහන්සේලා ද රැගෙන තව්තිසා දෙව්ලොවට වැඩමවීය. ශක්‍රදේවේන්‍ද්‍රයන් හමුවූ උන්වහන්සේ ඔහු සන්තකයෙහි ඇති දකුණු දළදා වහන්සේ හා දකුණු අකු ධාතූන් වහන්සේ අතුරෙන් අකු ධාතූන් වහන්සේ ඉල්ලා සිටියහ. එවදන් පිළිගත් ශක්‍ර දෙවිඳුන් සිළුමිණි සෑයෙහි තැන්පත් කොට තිබූ දකුණු අකු ධාතූන් වහන්සේ උන්වහන්සේට පිළිගැන්වූ අතර එම ධාතූන් වහන්සේලා රැගත් සුමන සාමණේරයෝ ලක්දිව සෑගිරියට වැඩම කොට මිහිඳු හිමියන්ට ඒ සියල්ල භාර කළහ.

සෑගිරියෙහි සිට අනුරාධපුර මහමෙව්නා උයන තෙක් ධාතූන් වහන්සේලා වැඩමවීම අති උත්කර්ශවත් අන්දමින් පුද පෙළහරින් සිදුකළ බව මහාවංශයේ දාහත්වන පරිච්ඡේදය සාක්‍ෂ්‍ය හෙළිකරන අතර ධාතු නිධානෝත්සවය හා බැඳි කතා පුවත ද ආශ්චර්යමත් සිද්ධියකි.

දේවානම්පියතිස්ස රජතුමා ප්‍රමුඛ පිරිස සෑගිරියට ගොස් සර්වඥ ධාතූන් වහන්සේලා සහ දකුණු අකු ධාතූන් වහන්සේ වන්දනා කොට සර්වඥ ධාතූන් වහන්සේලා එහිම හිඳුවා අකු ධාතූන් වහන්සේ පමණක් රැගෙන සවස් කාලයෙහි මහානාග වනයට ගොස් මංගල හස්තිරාජයා

සරසවා ධවලඡත්‍රය (සුදු මුතු කුඩය) නංවා ඇතු පිටට නැග "මේ සත්‍ය වශයෙන් ම බුදු රජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා නම් ධවලඡත්‍රය ඉවත නැමී ඇතු දෙදණ බිම නමත්වා, ධාතූන් වහන්සේ ඉබේට ම මගේ හිස මත්තෙහි පිහිටාවා යි " ප්‍රාර්ථනා කළේය. රජතුමා ප්‍රීති ප්‍රමෝදයෙන් ඉපිළ යමින් එකී ප්‍රාර්ථනාව එසේම සිද්ධ විය. අනතුරුව මහරජතුමා එම ධාතූන් වහන්සේ තැන්පත් කරඬුව මගුලැතු පිට තැන්පත් කළේය. හස්ති රාජයා ද සතුටින් කුඤ්චනාද කළ අතර මහ වැසි වසින්නට පටන් ගත්හ. සියලු දෙව් මිනිසුන් සාදු නදින් තම සතුට ප්‍රකාශ කළා සේම මග දෙපස සරසවා මහ පුද පෙළහරින් ධාතු පෙරහැර මහමෙව්නා උයනට ළඟා විය.

අනතුරුව අභය වැවෙන් (බසවක්කුලම වැව) පස් ගෙන මැටි සකස් කොට මිනිසුන් යොදවා මිහිඳු හිමියන්ගේ අවවාදයට අනුව වී ගොඩක ආකාරයෙන් සෑයක් කරවීය. ධාතු නිධානෝත්සවය දැක ගැණීම පිණිස දහස් ගණන් මිනිසුන් පැමිණ සිටි අතර තවත් ආශ්චර්යමත් සිද්ධියක් විය. එය බුදු රජාණන් වහන්සේගේ අවසන් ප්‍රාර්ථනා පහෙන් එකක් විය. මිහිඳු හිමියන් දේවානම්පියතිස්ස රජුට සැළකර සිටි එම ප්‍රාර්ථනා පහ මෙසේය.

- ❖ ධර්මාශෝක රජු ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ගනු පිණිස එහි ගිය විට බෝධි ශාඛාව ඉබේම පොළවෙන් මතුව රන් පාත්‍රයෙහි පිහිටාවා යි ප්‍රාර්ථනා කිරීම.
- ❖ එසේ පිහිටියා වූ බෝධි ශාඛාවෙන් සවනක් රැස් විහිදේවායි පැතීම.
- ❖ එම බෝධි ශාඛාව රත්‍රං පාත්‍රය සමගම අහසට පැන නැගී සත් දිනක් ම වළාගැබින් වැසී ගොස් පවතීවායි කළ ප්‍රාර්ථනය
- ❖ ථූපාරාමයෙහි දකුණු අකු ධාතුව පිහිටුවන දින ධාතූන් වහන්සේ අහසට පැන නැගී යමා මහ පෙළහරපාන සේක්වායි ප්‍රාර්ථනා කිරීම

❖ රුවන්වැලි මහා සෑයෙහි නිධන් කරනු ලබන ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේලා බුද්ධ ශරීරයක් මවාගෙන අහසට පැන නැගී යමා මහ පෙළහර පාන සේක්වායි ප්‍රාර්ථනා කිරීම.

මෙකී ප්‍රාර්ථනාවන්ගෙන් සිව්වන ප්‍රාර්ථනාවට අනුව එදින දකුණු අකු ධාතූන් වහන්සේ අහසට පැන නැගී සවනක් රැස් විහිදුවා යමා මහ පෙළහැර පෑවේය. නැවත ධාතූන් වහන්සේ රජුගේ හිස මත පිහිටි අතර රජතුමා ඉමහත් සන්තෝෂයෙන් යුතුව දකුණු අකු ධාතූන් වහන්සේ දාගැබෙහි තැන්පත් කළේය. මිනිසුන්ගේ සාදු නාද මැද මහ පොළොව කම්පා වී මහ වැසි වැටුණු බව වංශකතාවන්හි සඳහන්ය..

මෙලෙස ගෞතම බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට ඉදි කරන ලද ථූපාරාමය ලක්දිව සාසන ඉතිහාසයේ හමුවන පළමුවන දාගැබයි. ස්තූපය මූලික කරගෙන ගොඩනැගුණ ආරාමය නිසා මෙය ථූපාරාමය විය. ථූපාරාම දාගැබ ආරම්භයේදී අද පෙනෙන ඝණ්ටාකාර හැඩයෙන් නොව ධාන්‍යාකාර හැඩයෙන් නිර්මාණය කර තිබූ බව ථූපවංශය, සමන්තපාසාදිකාව මෙන්ම සිංහල බෝධිවංශයෙහි ද සඳහන්ය. එහෙත් දඹුලු ලෙන් විහාරයෙහි සිතුවම් කොට ඇති ථූපාරාම වෙහෙර වහන්සේ දිස්වනුයේ ඝණ්ටාකාර හැඩයෙනි. කෙසේ වුව ද ථූපාරාමය ධාන්‍යාකාර හැඩයෙන් පැවත ඇති අතර අවසන් වරට 1862 දී කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතුවලින් අනතුරුව මෙය ඝණ්ටාකාර ස්වරූපයට පත්ව ඇති බව පිළිගැනීමයි.

චෛත්‍යය වටා ක්‍රමවත්ව සිටුවන ලද ගල් කණු පේළි හතරකි. සෑම කුළුණකම ශීර්ෂය මනාව කැටයමින් විචිත්‍රවත් කරන ලද අතර ඒවාද එකිනෙකට අසමානකමින් යුත් කැටයමින් අලංකාර කොට වෙනම සාදවා කුළුණු කඳට සවිකොට ඇත. චෛත්‍යය ගර්භයට අඩි 03 ක් පමණ ඈතින් පිහිටා ඇති පළමු පේළියෙහි කුළුණු 52 ක් පමණ තිබී ඇති අතර ඒවා අඩි 22 අඟල් 10 ක පමණ උසකින් යුක්තය. දෙවන පේළිය උසින් අඩි 21 අඟල් 03 ක් පමණ වන අතර පළමු පෙළට වඩා අඩි 10 ක් පමණ

ඇතින් පිහිටුවා ඇත. එම පේළියෙහි කුළුණු 36 කි. කුළුණු 40 කින් යුතු තුන්වැන්න දෙවැනි පේළියට අඩි 09 අඟල් 07 ක් ඈතින් පිහිටුවා ඇති අතර එම කුළුණු උසින් අඩි 19 අඟල් 07 කින් පමණ සමන්විතය. අවසන් පෙළ තුන්වැන්නට අඩි 14 ක් ඈතින් හා උසින් අඩි 14 ක්ව පිහිටුවා ඇති අතර එහි ගල් කුළුණු 48 ක් පමණ තිබී ඇත. අද දක්නට ඇති ගල් කුළුණු ප්‍රමාණය සිදු වූ ආක්‍රමණ හමුවේ විනාශ වී ගොස් ශේෂව ඇති සංඛ්‍යාව වුව ද මෙහි ගල් කුළුණු 176 ක් පමණ තිබූ බවට මේ පිළිබඳව ගවේෂණය කළ ස්මිදර් මහතා පෙන්වා දී ඇත. ඔහුට, හොඳින් ආරක්ෂා වී තිබූ ගල්කණු 31 හා නටබුන් අතරට එක් වූ 103 ක් පමණ හමුවී ඇත.

ඇතුළු කවයේ සිට පිටත කවය දක්වා ක්‍රමිකව උස අඩුකොට නිර්මාණය කර ඇති මෙම කුළුණු පේළි හතර පිළිබඳ බොහෝ දෙනා විශ්වාස කරන මතය නම් මෙම ශෛලමය කුළුණු හිස් මත චෛත්‍යයට ආරක්ෂාව පිණිස වහලයක් සකස් කොට තිබී ඇති බවයි. විශිෂ්ඨ වාස්තු විද්‍යාත්මක අගයකින් යුත් මෙම ස්ථූපඝරය ක්‍රි.ව. 65-109 අතර රජ කළ වසභ රජු විසින් සකස් කරවන ලද්දක් වන අතර ක්‍රි.ව. 253-261 අතරෙහි සිරිලක රජ කළ ගෝඨාභය රජු විසින් නැවත ප්‍රතිසංස්කරණය කරන ලදි.

වර්තමාන ස්තූපය විශ්කම්භය අඩි 164 1/2 ක් වූ වෘත්තාකාර වේදිකාවක් මත පිහිටුවා ඇති අතර එය පොළොව මට්ටමේ සිට අඩි 11.4 ක් උස් වූ වේදිකාවකි. ස්තූපයේ වත්මන් උස අඩි 63 ක් වන අතර විශ්කම්භය අඩි 59 කි. තවද චෛත්‍ය මළුවට පිවිසීමට නැගෙනහිර හා බටහිර දෙසින් පියලැට පෙළ දෙකක් ඇති අතර එහි පාමුල අඩි 3 ක් විශ්කම්භය ඇති සඳකඩ පහණක් දක්නට ඇත. එසේම පූජනීය බිමට ඇතුළුවීමට පෙර සැදැහැවතුන්ගේ පා දෙවීම පිණිසි ජයල රඳවා තැබීමට සකස් කොට තබන ලද සුවිසල් ශෛලමය ජය බඳුනක් ද ඇත.

ථූපාරාමය හුදෙක්ම තවත් එක චෛත්‍යස්ථානයක් පමණක් ම නොව එය ආරාම සංකීර්ණයක් බව ඉහතදී ද සඳහන් කළෙමු. එලෙස චෛත්‍යය වටා ඉදිකරන ලද පරිවාර ගොඩනැගිලි සමූහයේ නශ්ටාවශේෂ පමණක් අද ඉතිරිව තිබුණ ද පරිපූර්ණ ආරාමයක

විශිෂ්ඨත්වය අදට ද විද්‍යමාන ය. ඒ අතර ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ලබාගත් පළමු අංකුර බෝධී හෙවත් අෂ්ඨඵලරුක බෝධීන් වහන්සේ නමක් චෛත්‍යයට අසලින් රෝපණය කර තිබූ අතර එම ස්ථානය යැයි සැලකෙන බෝධි ප්‍රාකාරයක නටබුන් වූ කොටස් අදට ද දක්නට ඇත. ථූපාරාම දාගැබට ආසන්නව ගොඩනැගිලි, ප්‍රතිමා ගෘහ, පිරිවෙන් සහ භික්ෂූන්ගේ ආරාම සැලකිය යුතු ප්‍රමාණයක් තිබූ බව දැනට ඇති නටබුන් අතුරෙන් අවබෝධ කරගත හැකි ය. ථූපාරාමය වනාහි පංචාවාස නමින් හැඳින් වූ ආයතන පහෙන් එකකි. අනෙක් හතර නම් මහා විහාරය, ඉසුරුමුණිය, වෙස්සගිරිය සහ චේතියගිරිය යි.

ස්තූපයට ගිණිකොණ දෙසින් තවත් ගොඩනැගිල්ලක නටබුන් රැසකි. එකී ප්‍රදේශය ආශ්‍රිතව ඇති බෙහෙත් ඔරුවක් නිසා එහි ආරෝග්‍ය ශාලාවක් තිබූ බවට සිතිය හැකිය. එම ගොඩනැගිල්ල ක්‍රි.ව. 898-914 අතර කාලය තුළ රජකළ සිව්වන කාශ්‍යප රජු විසින් ගිලන් භික්ෂූන්ගේ ප්‍රතිකාර උදෙසා ඉදිකරන ලද්දක් බවට විශ්වාස කෙරෙන නමුදු වෙනත් තොරතුරක් මෙතෙක් සොයාගෙන නැත.

ථූපාරාමයට දකුණින් එයටම යාබදව පිහිටා ඇති නටබුන් වූ ගොඩනැගිල්ල මෑතක් වන තුරුම හඳුන්වන ලද්දේ දළදා ගෙය නිමිනි. මෙය සැබවින්ම ප්‍රතිමා ගෘහයක් කිව හැකි සාධක බොහෝ ය. පළමුව මෙම ප්‍රතිමා ගෘහය දේවානම්පියතිස්ස රජු විසින්ම ඉදිකරන ලද්දක් වන අතර පසුව නොයෙක් රජවරු විසින් වැඩි දියුණු තත්වයට පත් කරන්නට ඇත. මෙම පිළිමගෙය තුළ තැනපත් කරන ලද බුද්ධ ප්‍රතිමාව ලාංකීය බුද්ධ ප්‍රතිමා ඉතිහාසයේ පළමු පියවර ලෙසට සැලකිය හැකි ය. පසුව මෙම ප්‍රතිමාව පළමුවන ජෙට්ඨතිස්ස රජු ( ක්‍රි.ව. 263-275) විසින් පාචීන පබ්බත විහාරයට ද ඉනික්බිතිව මහසෙන් රජු විසින් අභයගිරි විහාරයට ද ගෙන යන ලද බව මහාවංශයෙහි සඳහන් ය.

අද වන විට බැතිමතුන්ට චෛත්‍ය මළුවට ඇතුළුවීමට ඇති පියගැට පෙළට දකුණු පසින් පිහිටා ඇති පාදලාංචන චේතිය නමින් හඳුන්වන කුඩා චෛත්‍යයක නෂ්ටාවශේෂ දැකිය හැකි අතර එය මෙම

කල්පයෙහි බුදුවන බුදුවරුන්ගේ සිරිපතුල් සටහන් තබන පූජනීය ස්ථානයක් ලෙසට විශ්වාස කෙරේ. ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් සමන්තකූඨ පර්වතයෙහි සිරිපතුල් සටහන පිහිටුවා පසුව ථූපාරාම චෛත්‍යය පිහිටුවා ඇති ස්ථානයෙහි සමවත් සුවයෙන් වැඩ හිඳ මෙහි ද සිරිපතුල් සටහන පිහිටුවා අහසට පැන නැඟී දඹදිවට වැඩි බවද ප්‍රකට විශ්වාසයකි. මෑතක් වන තුරුම මෙම ස්ථානය සංඝමිත්තා තෙරණිය ආදාහනය කළ ස්ථානයෙහි පිහිටුවන ලද ස්තූපය ලෙසට වරදවා තේරුම්ගෙන තිබිණ. ථූපාරාමය අසලින් මහ සෑය දෙසට දිවෙන පෙත්මගට මදක් නුදුරින් පිහිටා ඇත්තේ සංඝමිත්තා තෙරණිය ආදාහනය කොට එම භෂ්මාවශේෂ තැන්පත් කොට උත්තිය රජතුමා විසින් කරවන ලද සංඝමිත්තා ස්ථූපයයි. එවැන්නක් ගැන සඳහන් වන ලක්දිව පිහිටි එකම ස්ථානය ද මෙය බව සිහි කටයුතුය. ථූපාරාමය වටා ඇති මෙම පරිවාර ස්ථාන පිළිබඳ තොරතුරු සවිස්තරව මතුවට දක්වා ඇත.

ලක්දිව වංශකථාවන් ථූපාරාමයට වරින් වර ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. එම තොරතුරු අතුරෙන් සංක්ෂේප විස්තරයක් මෙහිලා සටහන් කොට තැබීම යුක්ති සහගතය. වසභ රජු විසින් මෙයට වටදාගෙයක් ඉදිකරවන ලද බව ඉහතදී සඳහන් කළෙමු. පසුව එය ගෝඨාභය රජු (ක්‍රි.ව. 253-263 ) දෙවන අග්බෝ රජු ( ක්‍රි.ව. 604-614) සහ මානවම්ම රජු ( ක්‍රි.ව. 684-718) යන රජවරුන් විසින් නැවත පිළිසකර කරවන ලදි. අද වන විට චෛත්‍ය මළුවෙහි දක්නට ඇති ශෛලමය ගල්කුළුණු හා ඒවායේ නටබුන් මානවම්ම රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද වටදාගෙයි නටබුන් ලෙස විශ්වාස කෙරේ. එපමණක් ද නොව ක්‍රි.ව. 119-110 අතරතුර කාළයෙහි ලක්දිව රාජ්‍ය විචාළ ලංජිතිස්ස රජතුමා විසින් චෛත්‍යයට ශෛලමය කඤ්චුකයක් තනවා පූජා කළ බව සඳහන්ය. (කඤ්චුක යන්න පාලි භාෂාවෙන් හැට්ටය යන අරුත දෙන්නක් බැවින් මෙය ස්තූපයේ ඉහල කොටස ආවරණය වන සේ ගලින් කරවන ලද්දක් විය යුතුය) ක්‍රි.ව.

365-410 කාලයෙහි සිහසුන දැරූ පළමුවන උපතිස්ස රජු විසින් චෛත්‍යයේ කොතට රනින් නිමවන ලද කඤ්චුක ආවරණයක් සකස් කොට පූජා කරන ලද්දේය. ධාතුසේන රජු ( ක්‍රි.ව. 459-477) මෙහි අලුත්වැඩියා කටයුතු කළේය. දෙවන අග්බෝ රජ දවස ස්තූපයේ බදාම ගැලවී පරිහානිකර තත්වයක් උදා වූ අතර එහිදී රජු විසින් චෛත්‍යය හා වටදාගෙය සම්පූර්ණ වශයෙන් ම අලුත්වැඩියා කරන ලද අතර ධාතු ගර්භය ද සංරක්ෂණය කිරීමට සිදු වූ හෙයින් ධාතුගර්භය තුළ වැඩ සිටි අකු ධාතූන් වහන්සේ තාවකාලිකව ලෝවාමහාපායට වැඩමවා එහි තැන්පත් කොට ප්‍රතිසංස්කරණ කටයුතු අවසානයේ නැවත ධාතූන් වහන්සේ වෙනුවෙන් නොයෙක් පූජාවන් පවත්වා පූජා භාණ්ඩ රැසක් ද සමගින් චෛත්‍ය ගර්භයෙහි තැන්පත් කරවන ලදි.

කාලය කෙමෙන් ගෙවී යාමත් සමග අනුරාධපුර රාජධානියේ අවසන් කාල වකවානුව තුළ ථූපාරාමයට ද විවිධ උවදුරුවලට මුහුණ පෑමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 639-650 අතර රජකළ පළමුවන දාඨෝපතිස්ස රජු ස්වකීය භේවායන්ට වැටුප් ගෙවීමට මුදල් හිඟවීම මත ථූපාරාම ධාතු ගර්භය බින්දේය. චෛත්‍යයේ කොත හා ඡත්‍රය ද කොල්ලකන ලදි. ඉණික්බිතිව රාජ්‍යයට පත් දෙවන කාශ්‍යප රජු විසින් ස්තූපය ප්‍රකෘතිමත් කළ අතර මානවම්ම රජු ( ක්‍රි.ව. 684-718) ථූපාරාම ස්තූප සරයේ පියස්ස පිළිසකර කොට ඇත.. ක්‍රි.ව. 777-791 රාජ්‍යය විචාළ දෙවැනි මිහිඳු රජු ස්තූපය රන් හා රිදීමය කඤ්චුකයකින් ආවරණය කළහ. ක්‍රි.ව. 815-831 කාලයෙහි සිහසුන හෙබවූ දෙවන දප්පුල රජු ස්තූපසරය රුවන්මය ගඩොලින් බඳවා රුවන්මය දොරටු ද ස්ථාපනය කළේය.

තව ද සිව්වන කාශ්‍යප රජුගේ හා සිව්වන දප්පුල රජුගේ සෙනෙවිවරුන් කළ ආරාම දෙකක් ද දෙවන උදය රජු කරවූ ප්‍රාසාදයක් ද සිව්වන මහින්ද රජුගේ බිසව විසින් කරවූ කුඩා චෛත්‍යයක් හා ඊට බටහිරින් කරවන ලද පිරිවෙනක් ද තිබූ බව වංශකතාවන්හි සඳහන් ය. ගෝඨාභය රජු විසින් කරවූ සංඛපාල නම් පිරිවෙනක් ද ථූපාරාමය ආශ්‍රිතව පැවත ඇත.

එහෙත් නැවත ද ලක්දිවට පැමිණි ආක්‍රමණිකයන් අතරින් පාණ්ඩවයෝ ථූපාරාමය කොල්ලකෑහ. කඤ්චුකය ඇතුළු තවත් වටිනා බොහෝ දෑ ඔවුන් විසින් පැහැර ගන්නා ලදි. ක්‍රි.ව. 853-887 කාලය අතරතුර ලක්දිව ඔටුනු දැරූ දෙවන සේන රජු විසින් ස්වර්ණාලේපිත කඤ්චුකයකින් නැවත ස්තූපය ආවරණය කරන ලද අතර දෙවන උදය රජු එම කඤ්චුකය නැතුව රන් ආලේපිත කළේය. පසු කළෙක සිහසුනට පත් සිව්වන මහින්ද රජු රන් හා රිදී තීරු යොදා ස්තූපය අලංකාර කර ස්තූපඝරය පිණිස රුවන්මය දොරටුවක් ද සකස් කර පූජා කරන ලද මුත් දහවන සියවසෙහි අවසානයේ යළිත් සොළීහු සමස්ත ථූපාරාමයම සතු වස්තුව කොල්ලකන ලදි. අවසන් වරට නැවත මෙම ථූපාරාම විහාරාරාම සංකීර්ණය පිළිසකර කරන ලද්දේ දොළොස්වන සියවසෙහි රාජ්‍යත්වයට පත් මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.

දහනමවන සියවසේ මුල භාගයේදී අනුරාධපුරයේ අනෙකුත් සිද්ධස්ථාන මෙන්ම ථූපාරාමය ද නටබුන්ව තිබිණ. සමතලා වී ගොස් නොතිබුණ ද ස්තූපය ඉහළ කොටසේ පඳුරු වැවී පරිහානියට ගොස් තිබූ අතර පහළ කොටස ආරක්ෂා වී තිබිණ. මෙකී කරුණු කාරණා කෙසේ වෙතත් අනුරාධපුර අනෙක් සිද්ධස්ථාන හා සසඳා බලන කල ථූපාරාමය දීර්ඝ කාලයක් තිස්සේ නටබුන්ව නොපැවතී ඇති අතර අවිච්ඡින්නව රාජ්‍ය අනුග්‍රහය තුළ සංරක්ෂණය වූ එකම සිද්ධස්ථානය බවට පැවසීමට සාක්ෂි බොහෝ ය. එසේම අනුරාධපුර සිද්ධස්ථාන අතුරින් දහනමවන සියවසේ දී පළමුවෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලද සිද්ධස්ථානය ද ථූපාරාමයයි.

ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකිරීමෙන් අනතුරුව දාගැබ මූලික කරගෙන පශ්චාත් කාලීන රජදරුවන් විසින් ඉදිකරන ලද පරිවාර ගොඩනැගිලි පිළිබඳ තොරතුරු වංශකතාවන් ගෙනහැර දක්වන අතර ඉහතදී සංක්ෂේපයෙන් සඳහන් කළ එම පරිවාර ස්ථානයන් පිළිබඳව සැදැහැති පාඨක ඔබගේ අවබෝධය පිණිස මෙතැන් සිට විස්තර වෙයි.

# අෂ්ටඵලරුක බෝධින් වහන්සේ



ථූපාරාමය පිළිබඳව මහාවංසයේ සඳහන් වන සාක්ෂි සටහන්හි ඇතුළත් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් පළමු අංකුර අටෙන් එකක් ථූපාරාමයෙහි රෝපණය කිරීම පිළිබඳ කතා පුවත සුවිශේෂය. අටමස්ථාන අතුරෙන් ආදිතම සිද්ධස්ථානය ථූපාරාමය බව ඉහතදී සඳහන් කළෙමු. ථූපාරාමය ඉදිකොට සාසනය වෙනුවෙන් පූජා කිරීමෙන් අනතුරුව දේවානම්පියතිස්ස රජුගේ අවධානය යොමු වූයේ දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව සහ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ මෙහි වඩමවාගැනීම පිළිබඳවය. සාසනික දියුණුව වෙනුවෙන් විශිෂ්ඨ සේවාවන් රැසක් කළ රජු, තම බෑනණුවන් වූ අරිට්ඨ අමාත්‍යයා ප්‍රධාන දූත පිරිසක් දඹදිව ධර්මශෝක අධිරාජ්‍යයා වෙත යවා උඳුවප් පුන් පොහෝ දින බෝධි ශාඛාව සහ සංඝමිත්තා මෙහෙණින් වහන්සේද ලක්දිවට වඩමවා ගැනීමට සමත් විය. යාපනය අර්ධද්වීපයේ ඉහළ කොටස හෙවත් දඹකොළ පටුනේ සිට අනුරාධපුර මහමෙවුනා උයන තෙක් මග දෙපස උත්ව ශ්‍රීයෙන් සරසවා ඉමහත් පුද පෙරහරින්

වඩමාගෙන ආ බෝධීන් වහන්සේ මහමෙවුනා උයනෙහි වු රජගෙයි දොරටුව අබියස රෝපණය කළහ. අෂ්ටඵලරුක බෝධීන් වහන්සේලා හටගත් ආකාරය ද වංශකතාවන්හි සඳහන්වන ආකාරයට විචිත්‍රවත් වූ සිද්ධියකි. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා පහෙන් නැගෙනහිර ශාඛාවෙහි වු බෝ ඵලයක් පැසී ඉදී බිම පතිත වෙද්දී එය අතට ගත් මිහිඳු මාහිමියෝ එය රෝපණය කරන ලෙසට දේවානම්පියතිස්ස රජුට දුන්හ. රත්‍රං පාත්‍රයක රජතුමා විසින් එම බෝ ඵලය රෝපණය කරන ලද්දයෙන් එම ඵලයෙන් එවලේම බෝ පැල අටක් හටගත්තේය. අප සැම අතර ප්‍රකට අෂ්ටඵලරුක බෝධින් වහන්සේලා නමින් හඳුන්වනු ලබන්නේ මෙම බෝ පැල අටය. අනතුරුව රජතුමා මිහිඳු හිමියන්ගේ අනුදැනුම ද ඇතිව මේ බෝ පැල අට ඉසුරුමුණි විහාරය, ථූපාරාමය, දඹකොළපටුන, මිහින්තලය, තිවක්ක බමුණුගම, කතරගම, සඳුන්ගම හා අනුරාධපුර පඨමක විහාරය, යන ස්ථාන අටෙහි රෝපණය කළ බව මහාවංශය කියයි. ථූපාරාමයෙහි රෝපණය කරන ලද බෝධීන් වහන්සේ පිළිබඳව ඉන්පසු කිසිදු තැනක සඳහන් නොවන හෙයින් එය කෙතරම් කාලයක් පැවතුනේද, කිනම් කාලයක විනාශ වූයේදැයි නිශ්චය කරගත නොහැකි වුවද වරින්වර එල්ලවූ ආක්‍රමණ හේතුවෙන් අනුරපුර විහාරාම කොල්ලකන ලද අවස්ථාවන්හි මෙම බෝධීන් වහන්සේ ද කොල්ලකරුවන් විසින් විනාශ කරන්නට ඇතැයි සිතිය හැකිය. ථූපාරාමයට පිවිසෙන බටහිර දොරටුවට වම් පසින් ඇති නශ්ටාවශේෂ වූ ගොඩනැගිල්ල එම බෝධීන් වහන්සේ රෝපණය කොට තිබූ බොධි ප්‍රාකාරය ලෙස සැලකේ.

# පාදලාංඡන චෛත්‍යය



ථූපාරාමයට පිවිසෙන නැගෙනහිර පියගැට පෙළ සහිත දොරටුවට දකුණු පසින් දක්නට ඇති කුඩා ප්‍රමාණයක ස්තූපය පාදලාංචන චෛත්‍යයි. මෙය අද දක්නට ඇති ආකාරයට අඩි 4 ක් පමණ උස් වූ අඩි 116 ක් පමණ වටප්‍රමාණයක් ඇති වෘත්තාකාර වේදිකාවක් මත තනවා ඇති අතර උස අඩි 6 ක් පමණ වේ. පූර්ණ වශයෙන්ම ගඩොලින් නිමවා ඇති මෙම කුඩා චෛත්‍යය බොහෝ දෙනෙක් මෑතක් වන තුරුම හඳුන්වනු ලැබුවේ  සංඝමිත්තා චෛත්‍යය වශයෙනි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙම ස්තූපය නිසැක වශයෙන්ම සංඝමිත්තා ස්තූපය නොවන බව තහවුරු කරගැනීමෙන් අනතුරුව මෙය පාදලාංචන චෛත්‍යය ම බව ප්‍රකාශිත පුවරුවක් ස්තූපය අසලින් ස්ථාපිත කර ඇත. කෙසේ වෙතත් මෙය කවුරුන් විසින් ඉදිකරන ලද්දක්දැයි තොරතුරු මෙතෙක් සොයාගෙන නැත. කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම යන බුදු රජාණන් වහන්සේලාගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වූ පිං බිමක් වන ථූපාරාමය ඈත අතීත කාලයේ සිටම සිරිපතුල් වන්දනාවට ප්‍රකට ස්ථානයක් වන බැවින් මෙය පසු කාලීන රජවරයෙකු විසින් ඉදිකරවන්නට ඇත. ථූපාරාම ස්තූපය වන්දනා කරන සැදැහැති ජනයා පාදලාංචන චෛත්‍යයට ද මල් පහන් පිදීම පුරුද්දක් ලෙස අදට ද සිදුකරයි.

# සංඝමිත්තා ස්තූපය



ප්‍රධාන පාරෙන් ථූපාරාම පෙත්මගට පිවිසෙත්ම වම් පසින් ඉපැරණි ගොඩනැගිලි සමූහයක නශ්ටාවශේෂ දැකගත හැකි ය. ඒ අතර පෙත්මගට තරමක් ඈතින් පිහිටා ඇති කුඩා චෛත්‍යයක නශ්ටාවශේෂ දැකගත හැකි අතර එය සංඝමිත්තා ස්තූපය ලෙසට තහවුරු කරගෙන ඇත. අඩි 33 ක් දිග හා පළල ඇති සම චතුරස්‍රාකාර ශෛලමය වේදිකාවක් මත අඩි 4 අඟල් 6 ක් පමණ උස් වූ අඩි 50 ක වට ප්‍රමාණය ඇති ගරා වැටුණු කුඩා ස්තූපයක් වන මෙය සංඝමිත්තා මහ රහත් තෙරණින් වහන්සේ සිහිවීම සඳහා තනවා ඇත. සංඝමිත්තා තෙරණිය බොහෝ කල් වැඩ වාසය කොට ඇත්තේද මෙම ස්ථානයෙහි ම වන අතර පිරිනිවීමෙන් පසු ආදාහන පූජෝත්සවය ද මෙහි ම සිදුකොට මෙම චෛත්‍යය ඉදිකර ඇති බව විශ්වාසයයි. උත්තිය රජතුමා විසින් ඉදිකරවන්නට ඇතැයි සැලකෙන මෙහි බටහිර දිශාවෙන් චෛත්‍ය වේදිකාවට ගොඩවීම සඳහා සකස් කරවන ලද පියගැටපෙළක් ද ඇත.

# පිළිම ගෙය



චෛත්‍ය මළුවට ඇතුළුවීමට ඇති ප්‍රධාන දොරටුවට වම් පසින් දැනට නටබුන්ව ඇති ඉපැරණි ශෛලමය ගොඩනැගිල්ල ථූපාරාම පිළිම ගෙයයි. සඳකඩ පහණ, මුරගල්, විචිත්‍රවත් කැටයමින් යුත් ගල් කුළුණුවලින් ද සුසැදි මෙය දළඳා වහන්සේ කලක් වැඩ සිටි සිද්ධස්ථානයක් යැයි මතයක් පැවතිය ද නිශ්චිත තොරතුරක් සොයා ගැනීම අසීරුය. එහෙත් මහාවංශයේ සඳහන් තොරතුරකට අනුව මෙම ගෘහය එවැන්නක් වෙනුවෙන් භාවිත කරන්නට ඇතැයි සිතීම ද යුක්ති සහගතය. එහි සඳහන් අයුරින් තුන්වන සේන රජතුමා (ක්‍රි.ව.938-946) දළඳා වහන්සේ සතර විහාරයට වැඩමවා දළඳා පූජාවන් පැවැත්වූ බව කියවේ. සතර විහාරය යනු මහා විහාරය, ථූපාරාමය, අභයගිරිය හා ජේතවනාරාමයයි. මෙම පිළිමගෙය තාවකාලික අවශ්‍යතාවයකට ඉදිකරන ලද්දක් නොවන බව එහි ඇති විශිෂ්ඨත්වය ගැන අධ්‍යයනය කිරීමෙන් වැටහී යන බැවින් දළඳා වහන්සේ තැන්පත් කිරීමට ම මෙය ඉදිකරන්නට ඇතැයි සිතීමට ඇති අවස්ථාව ද ගිලිහී යයි.

කෙසේ වුව ද මෙම ගෘහය බුදු රජාණන් වහන්සේ වෙනුවෙන් පුද පූජා පැවැත්වීමට අවැසි සියලු අංගයන්ගෙන් සමන්විත බුද්ධ මන්දිරයක් ව තිබූ බව කිව මනාය. විශේෂයෙන්ම ථූපාරාම ස්ථූපය ඇසුරින් ඉදි වූ

ආරාමයට අවශ්‍ය බුදු මැදුර ලෙසට මෙය ඉදිකරන්නට ඇත . මෙම ප්‍රතිමා ගෘහය තනා ඇත්තේ අඩියර දෙකක් ඔස්සේ ය. ගර්භගෘහය අඩි 21×21 වූ චතුරශ්‍රයකි. මණ්ඩපය අඩි 24.8×18.10 ක් පමණ වන අතරම මෙය පසුකාලීනව එකතු කරන ලද්දකි. මෙහි මධ්‍යස්ථයෙහි හිටි බුදු පිළිම වහන්සේ නමක් තැනපත් කොට තිබූ බවට නශ්ටාවශේෂ සාක්ෂි දරයි. ප්‍රතිමාගෘහය ද 9-10 සියවස්වලට අයත් යැයි සැලකිය හැකි දොරටුපාල රූපවලින් හා අලංකාර සඳකඩපහණින් විචිත්‍රවත් කර ඇති අතර අඩි 85×57 ක් පමණ වූ වේදිකාවක් මත සමස්ත ප්‍රතිමා ගෘහය ඉදිකොට ඇත.

පළමුව මෙම ප්‍රතිමා ගෘහය දේවානම්පියතිස්ස රජු විසින්ම ඉදිකරන ලද අතර පසුව නොයෙක් රජවරු විසින් වැඩි දියුණු තත්වයට පත් කරන්නට ඇත. මෙම පිළිමගෙය තුළ තැනපත් කරන ලද බුද්ධ ප්‍රතිමාව ලාංකීය බුද්ධ ප්‍රතිමා ඉතිහාසයේ පළමු පියවර ලෙසට සැලකේ. මෙම ප්‍රතිමාව පසු කලෙක පළමුවන ජෙට්ඨතිස්ස රජු ( ක්‍රි.ව. 263-275) විසින් පාචීන පබ්බත විහාරයට ද ඉනික්බිතිව මහසෙන් රජු විසින් අභයගිරි විහාරයට ද ගෙන යන ලද බව මහාවංශයෙහි සඳහන් ය.

# නැගෙනහිර දොරටුව



ථූපාරාම සෑ මළුවට පිවිසීම සඳහා නැගෙනහිරින් හා බටහිරින් ප්‍රවේශ ද්වාරයන් දෙකකි. නැගෙනහිර දොරටුවේ පියගැටපෙළ අදියර දෙකකින් යුක්තය. ඉන් පළමුව ඇති පහත කොටසේ පියගැට දොළහකි. සම්පූර්ණයෙන්ම ගලින් නිමවා ඇති මෙම පියගැටපෙළ ගල් පුවරු එක්කොට තනවන ලද්දකි. පියගැටයක දිග අඩි 15 අඟල් 10 ක් පමණ වන අතර පියගැටපෙළට පිවිසීමට මත්තෙන් පළමු පියගැටයට සමාන්තරව පිහිටුවන ලද දිග අඩි 3 යි අඟල් 1 ක් පමණ වන කුඩා සඳකඩ පහණක් ඇත. එය පළලින් අඩි 2 අඟල් 1 කි.

දොළොස්වැනි පියගැටයේ සිට ඇති පියගැටපෙළෙහි දෙවන අදියර පියගැට 6 කින් සමන්විත වෙයි. මෙහිද පියගැටපෙලට ප්‍රවිෂ්ට වීමට මත්තෙන් කවාකාර සඳකඩ පහණක් වේ. එහි විෂ්කම්භය අඩි 2

අඟල් 7 ක් වන අතර සුපුෂ්පිත නෙළුම් මලක් එහි මැද කැටයම් කර තිබේ. පියගැටපෙළේ පහත කොටසේ අත්වැල් දෙක මෑත කාලයේදී ප්‍රතිසංස්කරණය කරන ලද්දක් බව මැටි බදාමයකින් ගඩොල් බැඳ කපරාරු කර ඇති බැවින් කවරෙකුට වුවද වටහා ගත හැකිය. පියගැට පෙළේ අත්වැල් මකර මුඛ හා ලියවැල් සහිත කොරවක්ගලින් යුක්ත වන අතර පහළ සහ ඉහල දෙකොටසේම මුල දෙක බැගින් මුරගල් හතරක් වේ. මුරගල්හි මානවරූපයන්හි හිස වටා නාග පෙන නවයක් බැගින් කැටයම් කර ඇත.

# සලපතළ මළුව



'සල' නම් ශෛලමය යන අදහස දෙන්නකි. 'පතළ' යන්නෙන් අතුරා ඇති යන අදහස ගම්‍ය වෙයි. එනයින් ගල් අතුරා ඇති මළුව යන අදහසින් සලපතළ මළුව යැයි කියති. පියගැටපෙළ නැග වළාකුළු බැම්මේ දොරටුවෙන් සෑ මළුවට හෙවත් සලපතළ මළුවට පිවිසිය හැකිය. එහෙත් මෙම පිවිසෙන කොටස නියම සලපතළ මළුවට වඩා අඟල් 9 ක් පමණ පහතින් පිහිටි දිගින් අඩි 18 යි අඟල් 9  ක් හා පළලින් අඩි 14 යි අඟල් 6 ක් පමණ චතුරස්‍රාකාර වේදිකාවකි. බටහිර දොරටුවෙන් සලපතළ මළුවට පිවිසෙන ස්ථානයෙහි ද මෙවැනිම චතුරස්‍රාකාර වේදිකාවක් දැක ගැත හැකිය. නැගෙනහිර දොරටුවෙන් නැගී පිවිසෙනු ලබන්නේ ථූපාරාම ස්තූපය වටා ඉදිකොට තිබූ පැරණි ථූපඝරයේ ප්‍රවේශ ද්වාරයටය. මෙහි ථූප ඝරයට පිවිසෙන දොර සවිකර තිබූ උළුවස්ස සිටුවූවා යැයි සැලකෙන වලවල් දෙකක් දක්නට ලැබේ. 10 වැනි සියවසේදී ලක්දිව රාජ්‍ය විචාළ තුන්වැනි සේන රජු විසින් සවි කරන ලද හිරු රැසින් බබලන රනින් නිමකළ දොර සවිකොට ඇත්තේ මෙහි ය.

## බටහිර දොරටුව

ථූපාරාම ස්තූපය වෙත නැගීම සඳහා බටහිර දෙසින්ද පියගැට 15 කින් යුත් පියගැටපළෙක් වේ. මේ පියගැටපෙළ පාමුල නැගෙනහිර දොරටුව අසල පිහිටියාක් මෙන් සඳකඩපහණ හෝ කොරවක්ගල්, මුරගල්, දක්නට නැත. පියගැටපෙළ මුදුනේ සලපතල මළුවේ පහත කොටසක් වේ. මෙය පළලින් අඩි 17 යි අඟල් 4 ක් හා අඩි 18 යි අඟල් 10 ක් පමණ දිගින් යුක්ත වු ද ප්‍රදේශයකි. මෙතැනින් ථූපසරයට පිවිසීම සඳහා දොරක් තිබු බවටද සලකුණු නැත. ආරක්ෂක හේතූන් මත දැනට බටහිර දොරටුව වසා ඇත.

## පා දෝණිය/ගල් බඳුන



ස්තූපයේ නැගෙනහිර දෙරටුවේ පියගැටපෙළට වම් පසින් අඩි 6 අඟල් 5 ක් දිග වූද, අඩි 4 අඟල් 11 ක් පළල වූ ද, අඩි 2 අඟල් 6 ක් උස් වු ද, ගලින් කළ භාජනයක් වේ. විශිෂ්ට නිර්මාණයක් වන මෙම ගල් භාජනය තනි ගලකින් ම නිර්මාණය කර ඇති බව දැකිය හැකිය. දෙපා සෝදා පිරිසිදු වී පූජනීය ස්ථානයකට පිවිසිය යුතු අතර එම ඉපැරණි චාරිත්‍රය තත් කාලීන ආගමික පරිසරය තුළ මුල්බැස තිබූ බව මෙමගින් පැහැදිලිය. පූජනීය ස්ථානයකට පමණක් නොව සංඝාරාමයකට වුවද ඇතුළු වුයේ පා දෙවීමෙන් අනතුරුවය.

# නාගලු ලිඳ



පිළිමගෙයින් අඩි 17 ක් පමණ දකුණුපසට වන්නට සතරැස් ගල් පුවරු වලින් ආවරණය කළ කුඩා ළිඳක් දැකිය හැකිය. මෙම ළිඳේ ඇතුළත බිත්ති ද පිටත ද ආවරණය කර ඇත්තේ ගල් පුවරු එක මත එක තබා ය. ''නාගලු ළිඳ'' නමින් ව්‍යවහාර කෙරෙනු ලබන මෙම ළිඳ රුවන්වැලි සෑය වැඩීමට නා ලොව සිට පැමිණි නාගයන් මතුවූ ස්ථානය යැයි ජනප්‍රවාදයේ පවතී.

# ඉපැරණි රෝහල



අභය වැව හෙවත් බසවක්කුලම වැව අසල සිට ථූපාරාමය දෙසට වැටී ඇති මාවතින් පැමිණෙන අයෙකුට අඩි 81 ක් පමණ දිගින් හා පළලින් අඩි 78 ක් පමණැති ඉපැරණි ගොඩනැගිල්ලක නශ්ටාවශේෂ දැකිය හැකිය. මෙම ගොඩනැගිල්ල මැද හිස්ය. දකුණු දෙසට ප්‍රධාන දොරටුව හා උතුරු දෙසට කුඩා දොරක් ද තිබී ඇති අතර කැඩී බිඳී ගිය ගල් කණු පේළි දෙකක් වේ. කැඩී බිඳී ගිය ගල් කණු අතර කුඩා ප්‍රමාණයේ කාමරයක් යැයි සිතිය හැකි ඉදිකිරීමක නටබුන්ය. එම නශ්ටාවශේෂ පිළිබඳ අධ්‍යයනයේදී මෙවැනි කාමර 26 ක් පමණ තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. උතුරට ඇති කුඩා දොරටුව අසල අඩි 2ක විෂ්කම්භය ඇති ඇඹරුම් ගලක් ලෙස සැළකිය හැකි රවුම් ගල් භාජනයක් තිබේ. මෙම ගොඩනැගිල්ලෙහි පිහිටීම හා කාමර වෙන්කිරීම අනුව එය පැරණි රෝහලක් වීමට බොහෝ දුරට ඉඩ තිබේ. පිහිටීම අනුව හා ගොඩනැගිල්ලේ ඇතුළත නටබුන් පිරික්සීමෙන් ථූපාරාමයේ පිහිටි රෝහල මෙය යැයි නිශ්චය කරගත හැකිය.

# බෙහෙත් ඔරුව



ලාංකීය ජන සංස්කෘතිය හා බැඳුණු ඉපැරණි දේශීය වෛද්‍ය ක්‍රමයට ඇත්තේ අද්විතීය ඉතිහාසයකි. එම ඉපැරණි වෛද්‍ය ක්‍රමය හා බැඳුණු ප්‍රතිකාර ක්‍රම අතර ඇතැම් රෝගීන් ඖෂධීය ජලය පිරවූ භාජනයක සතපවා තැබීම සිදුකර ඇති බව වටහාගත හැකිය. මෙසේ රෝගීන් සතපවා තැබූ භාජනය හඳුන්වන ලද්දේ බෙහෙත් ඔරුව නමිනි. ථූපාරාමය අසලින් හමුවූ මෙම බෙහෙත් ඔරුව අඩි 7 අඟල් 4 ක් දික් වූ ද, අඩි 2 අඟල් 5 ක් පළල් වු ද එක ම ගලකින් නිමවන ලද භාජනයකි. මෙම ගල් භාජනයෙහි උස අඩි 1 අඟල් 3 ක් පමණ වේ. එහි මැද මිනිස් සිරුරක් තැන්පත් කළ හැකි අයුරින් අඟල් 10 ක් ගැඹුරට හාරා තිබේ. සිරුර තැන්පත් කරන කුහරයෙහි දිග (මිනිස් උස) අඩි 6 කි.

# සිරිපා වන්දනාව



ථූපාරාම පුදබිම හා බැඳි ඉතිහාසය හැදෑරීමේදී බුදු රජාණන් වහන්සේගේ සිරි පතුල් වන්දනාව හා බැඳි පූජනීයත්වයෙන් ද මෙම පුදබිම ඈත අතීතයේ සිටම ප්‍රකටව තිබූ බව කිව යුතුය. ඉහතදී තොරතුරු ගෙනහැර දක්වන ලද සෑ මළුවට ආසන්නව පිහිටා ඇති පාද ලාංඡන චෛත්‍යය ද ථූපාරාමය ආශ්‍රිතව පැවති සිරිපතුල් වන්දනාවේ තවත් එක ප්‍රතිඵලයකි. බුදු සිරුරේ ඇති මහා පුරුෂ ලක්ෂණ හා දෙපා යුග්මයෙහි පිහිටි මගුල් ලකුණු විශේෂ්‍ය කරුණින් ධර්මයෙහි සාකච්ඡා වන අතර පිළිම වන්දනාව ආරම්භ වීමට මත්තෙන් බුදුන් වහන්සේව දැක්විය යුතු තැන්හි සිරිපතුල් නෙළීම ශිල්පීන් විසින් අනුගමනය කරන ලද්දකි.

ථූපාරාම සෑ බිමෙහි නැගෙනහිර දොරටුවෙන් සලපතළ මළුවට පිවිසෙන අයෙකුට ප්‍රධාන මලසුනට දකුණු පසින් චෛත්‍යයට ආසන්නවම තබා ඇති තරමක් විශාල ශෛලමය පුවරුවක් දැකිය හැකිය. එනම් සිරිපතුල් ගලයි. අතීතයේ සිට මිනිසුන් මෙම සිරිපතුල් ගල හිස තබා නමස්කාර කිරීමට හුරුව තිබුන ද කාලයාගේ අවෑමෙන් එය ව්‍යවහාරයෙන් ගිලිහී ගිය බවක් දැකිය හැක. අදවන විට ඒ පිළිබඳ දැනුවත්කම ඇත්තේ ද සැදැහැවතුන්ගෙන් අල්ප පිරිසකටය.

මෙම සිරිපතුල් ගල දිගින් අඩි 3 අගල් 3 ක් හා පළලින් අඩි 1 අගල් 10 ක් පමණ වේ. ඝනකමින් අඩු මෙම ගල් පුවරුවේ සිරිපතුල් යුගල දෙකක් ඉස්මතුව පෙනෙන්නට ඇත. වම්පස සිරිපතුල් යුගලයට වඩා දකුණුපස සිරිපතුල් යුවල සිහින්ව නිර්මිතය. මෙම සිරිපතුල් ගලට අමතරව වෙහෙර වහන්සේට බටහිර පැත්තේ පිහිටි පිළිම ගෙය තුළද සිරිපතුල් ගල් හයක් දැකිය හැකිය. එම සිරිපතුල් ගල් ද ථූපාරාමය සිරිපතුල් වන්දනාවට විශේෂ තැනක් ලෙසින් ප්‍රකටව තිබූ බවට සාක්ෂි හෙළිකරයි. මෙලෙස ථූපාරාමය සිරිපතුල් වන්දනාවට විශේෂත්වයකින් බුහුමනට පාත්‍ර වීමට හේතු රාශියකි.

අප ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩි තුන්වැනි වාරයේදී අනුරාධපුර අටමස්ථාන පිහිටි ස්ථානයන්හි සමාධි සුවයෙන් වැඩ හිඳ පසුව මෙම ථූපාරාම පුණ්‍ය භූමියෙහි ද විවේකී සුවයෙන් ගත කොට ස්තූපය පිහිටි තැනට නැගෙනහිරින් වූ ස්ථානයකින් අහසට නැගී දඹදිවට වැඩම කළ බවත් එසේ ම ඉන් පූර්වයෙහිද කකුසඳ, කෝණාගමන, කාශ්‍යප යන තුන් බුදුවරයන් ද අනුරාධපුරයෙන් නික්ම අහසට නැගුණේද ථූපාරාමය අසලින් බව ඉපැරණි පිළිගැනීමය. පාදලාංචන චෛත්‍යයට අමතරව එයට නැගෙනහිරින් කෝණාගමන, කාශ්‍යප හා ගෞතම යන කාශ්‍යප බුදුරදුන්ගේ පා සටහන් සහිත චෛත්‍ය ඉදි වී තිබුණු බව කියවේ. මහාවංස ටීකාව කරුණු ගෙනහැර දක්වන ආකාරයට කාශ්‍යප බුදුරදුන්ගේ පා සටහන් පිහිටි තැන උත්තිය රජු විසින් චෛත්‍යයක් කරවන ලද බවත් මෙහිලා සඳහන් කළ යුතුය. මෙකී කරුණු සියල්ලෙහි සාරාංශය ලෙස මෙම ථූපාරාමය පිංබිම සිරිපතුල් වන්දනාවට විශේෂ තැනක් දී ඇති බව පැහැදිලි කරුණකි.

# උපෝසථ ඝරය



ථූපාරාම ස්තූපය අවට ඇති ගොඩනැගිලි අතර උපෝසථ ඝරය මහාවංශය සාක්ෂි ගෙනහැර දක්වන තවත් එක විශිෂ්ට නිර්මාණයකි. ස්තූපය ඇසුරු කොටගෙන බිහිවූ ආරාමයේ වැඩ සිටි භික්ෂූන්ගේ විනය කර්ම සිදු කිරීම පිණිස ගොඩනංවන ලද මෙම උපෝසථඝරය ක්‍රි.පූ. 19-9 අතර කාලය තුළ සිහසුන හෙබවූ භාතිකාභය රජු විසින් ඉදිකරන ලද්දකි. පසු කාලීනව ලක්දිව රාජ්‍ය විචාල භාතිකතිස්ස, ගෝඨාභය, දෙවන අග්ගබෝධි, දෙවන මහින්ද ආදී රජවරු විසින් ප්‍රතිසංස්කරණය කරවන ලද මෙම උපෝසථඝරය සුවිසල් ගල් කණු රාශියක් පමණක් ඉතිරිව නශ්ටාවශේෂව පවතී. ලෝවාමහාපාය අනුරාධපුර මහා විහාර සීමාව තුළ ඉදි වූ පළමු උපෝථඝරය වන අතර දෙවැන්න ථූපාරාම උපෝසථඝරයයි. ලෝවාමහපායේ ගල්කණු පිහිටුවා ඇති ආකාරයට තරමක සමානකමක් මෙහි ඇති බව සමීපයෙහි සිටුවන ලද ගල්කණුවලින් පැහැදිලිය.

දාගැබ් වහන්සේට නිරිත දෙසින් පෙනෙන ගල් කණු සමූහයකින් හෙබි ගොඩනැගිල්ල ථූපාරාම උපෝසථ ගෘහයයි. උසින් අඩි 6 ක් පමණ වන මාලකයක් මත ඉදිකරවා ඇති මෙහි දැනට අඩි 10 ක් පමණ උසැති

ගල් කණු 60 ක් ශේෂව ඇත. ප්‍රවිශ්ට ද්වාරය සඳකඩපහණ, මුරගල් සහ කොරවක්ගලින් විචිත්‍රවත් කර ඇත.

මෙලෙස අපගේ සාකච්ඡාවට බඳුන් වූ ථූපාරාමය අවට ඇති නෂ්ටාවශේෂව පවතින ගොඩනැගිලි අතර සඳහන් නොකරන ලද අවශේෂ ගොඩනැගිලි සමූහයක් මෙන්ම තවමත් හඳුනා නොගත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් හෙබි ස්ථාන රැසක් ඇති බව ද කිව යුතුය. සලපතළ මළුවේ ස්තූපයට දකුණු පස අපිළිවෙලට සිටුවා ඇති ගල්කණු පහක් පමණ දැකිය හැකි අතර මෙය ස්තූපයට අයත් වටිනා දෑ තැන්පත් කොට තැබීමට භාවිත කළ භාණ්ඩාගාරයක් යැයි ජේ.ජී. ස්මිතර් මහතා පෙන්වා දෙයි. පධානඝරය හෙවත් භාවනානුයොගී භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පිණිස තනවන ලද ගොඩනැගිල්ලේ නශ්ටාවශේෂ ද ස්තූපයට තරමක් ඈතින් දැකිය හැකිය. ප්‍රධාන පාරෙන් පෙත්මග දිගේ පැමිණ පුදබිමට ඇතුළුවන තැනම ගල්කණු රැසකින් යුක්ත ස්ථානය ථූපාරාම මුරගෙය යි. එතැන් සිට ගඩොලින් නිම කළ ප්‍රාකාර බැම්මෙන් ඇතුළු පැත්ත ථූපාරාම වැලි මළුවයි. මුර ගෙය, පිළිම ගෙය, නාගලු ළිඳ, පාදලාංචන චෛත්‍යය හා අෂ්ඨඵලරුක බෝධි ප්‍රාකාරයද පිහිටා ඇත්තේ වැලි මළුව තුළය.

ථූපාරාමයේ අද දක්නට ඇති භික්ෂූන්ගේ ආරාමය ඉදිකරන ලද්දේ විසිවන සියවසේ මුල භාගයේදී ය. චෛත්‍යය අසල ආණ්ඩුවෙන් ප්‍රදානය කරන ලද භූමි භාගයක පන්සලක් පිහිටුවීමේ කටයුතු 1912 දී අරඹන ලදි. අටමස්ථාන කමිටුවෙන් භාරකරන ලද නුවරකලාවියේ සංඝනායක පදවිය දරූ උඳුරව සුමන නායක හිමියෝ පොල් අතු වලින් සෙවිලි කරන ලද කටුමැටි ගැසූ කුටියක වැඩ හිඳිමින් පන්සලේ කටයුතු අරඹා පසුව උන්වහන්සේගේ ගෝල නමක් වූ උඳුරව ධම්මදින්න හිමියන්ට පන්සල භාරකරන ලදි. උනවහන්සේගේ කල සිංහල උළු සෙවිලි කරන ලද නව ආවාසයක් ඉදිකරන ලද අතර 1945 දී අව්කන පංසලේ භාරකාරත්වයට පත්වූ උන්වහන්සේ එහි වැඩියහ. අනතුරුව පයින්ඩිකුළමේ සුමන හිමියෝ මෙහි විහාරාධිපති පදවිය හෙබවූ අතර උන්වහනසේගේ

අපවත්වීමෙන් පසු එවකට රුවන්වැලි චෛත්‍යාරාමයේ වැඩ සිටි ගල්කිරියාගම සෝරත හිමියෝ 1971 දී ථූපාරාම භාරකාරත්වයට පත්කරන ලදි. පුරා අවුරුදු 46 ක් තිස්සේ සෝරත නාහිමියන් මෙහි විහාරාධිපති පදවිය හෙබවූ අතර 2017 පෙබරවාරි මස 13 වන දින උන්වහන්සේ අපවත්වීමත් සමග පූජ්‍ය කහල්ලේ ඤාණින්ද හිමියෝ ථූපාරාමයේ විහරාධිකාරී තනතුරට පත්වූහ.

# ථූපාරාම මහ සෑ වන්දනාව

සම්බුදු දහමට නිති ගරු කරනා
දම්සෝ නිරිඳුන් දඹදිව සිටිනා
ලක්මිණිතලයට නෙත සිත යොමනා
දහම පතුරුවන ලෙස අණ කෙරුණා

මහින්ද මහ රහතුන් දහමත් ගෙන
ඉත්තිය උත්තිය සම්බල සමගින
හද්දසාල හිමි සුමන හෙරණ යන
භණ්ඩුක උවසු ද වැඩියා අහසින

පාලුව තනිකම සිතට දැනෙනවා
බුදු හිමි මනසට නිති සිහිවෙනවා
විහිඳුණු දම්කඳ වෙත සිත යනවා
ධාතු වැඩමවීමට සැරසෙනවා

සුමන හෙරණ සමිඳුනි කියමින්නේ
මිහිඳු සමිඳු හිමි හට අමතන්නේ
අකුධාතුව දෙව්ලොව වැඩ ඉන්නේ
එය එතැනින් ගෙන එනුය කියන්නේ

ලක්මිණිතලයෙන් හිමි නික්මෙන්නේ
දෙව්ලොව දෙවියන් වෙත වඩිමින්නේ
සක්දෙවිඳුට තොරතුරු පවසන්නේ
දකුණකුධාතුව ඉල්ලා ගන්නේ

රැස්වන දෙව් පිරිසක් සමගින්නේ
විස්මිත ලෙස එය බලා සිටින්නේ
දස්කම් පා ධාතුව පිළිගන්නේ
ලස්සන දෙව් පුරයෙන් නික්මෙන්නේ

රන් බඳුනක ධාතුව   දරමින්නේ
සිල්ගුණ පිරි හිමි සඳ   වඩිමින්නේ
ලක්මිණිතලයට හිමි   බැසගන්නේ
ආසිරි ගෙන මහ වැස්ස   වැටෙන්නේ

සිහිල් සුවඳ සීතල පැන්   දහරේ
මහ පිරිවර සැදැහෙන් බිම   වැතිරේ
මුවගින් මුවගට බුදු ගුණ   මැතිරේ
සාදු සාදු හඬ දසතම   පැතිරේ

දේවානම්පියතිස්   නිරිඳුන්නේ
හද මඩලම සැදැහෙන්   උතුරන්නේ
දකුණකුධාතුව පෙළහර   දුන්නේ
මගුල් ඇතු ද දණ බිමට   නමන්නේ

සිනිඳු සුමුදු බුදුගුණ   මතුරාගෙන
දෝත පුරා සැම මල්   පුරවාගෙන
දකුණකුධාතුව හිසින්   දරාගෙන
රැගෙන ගියා රජ මැදුර   බලාගෙන

සෑය තනන පිං බිම   සකසනවා
සුවඳ තැවරූ තෙත මැටි ද   ගෙනෙනවා
ගණ්ඨාකාරව හැඩය   පෙනෙනවා
ථූපාරාමේ සෑය   දිලෙනවා

අප ගෞතම සම්බුදු   සමිඳුන්ගේ
දකුණකුධාතුව මෙහි වැඩ   ඉන්නේ
කිරි බිබුළක් සේ සෑය   දිලෙන්නේ
ථූපාරාමය මම   නමදින්නේ

සිව්මහ බුදුවරු වැඩ සිටි   පිංබිම
සමවත් සුවයෙන් කල්ගෙවූ   පිංබිම
සිව්මහ බුදු ගුණ රැව්දෙන   පිංබිම
අපිත් වඳිමු සතොසින් මේ   පිංබිම

සිහිළැල් පවනේ සුවය    දැනෙනවා
විහිදුන බුදුගුණ මනසෙ    රැඳෙනවා
ථූපාරාමෙට දෙවියො    වඩිනවා
සිහිල් පැනින් අපි සෑය    පුදනවනා

සුරන් බඹුන් මහ සෑය    වඳින්නේ
සරින් මුනිඳු ගුණ සිහි    කරමින්නේ
පහන් සිතට බුදු සමිඳු    පෙනෙන්නේ
ගිලන් පසින් අපි සෑය    පුදන්නේ

සසර නොතිර බව මට    වැටහෙනවා
දුකට හේතු තණ්හා    මැඩලනවා
ථූපාරාමය සෙත    සලසනවා
සුවඳ මලින් අපි සෑය    පුදනවා

ගෞතම සම්බුදු සසුන    දිලේවා
සතර අපායේ දොරටු    වැසේවා
සිතින් ගතින් අප පිංවත්    වේවා
පුදන පහන් සිළු පූජා    වේවා

සිරස නමා සෑ රදු    නමදිනවා
නිසල සිතට බුදුගුණ    සිහිවෙනවා
පවිටු නුගුණ මනසින්    නික්මෙනවා
කඤ්චුක පුද දී සෑය    වඳිනවා

ගෞතම මුනිඳුගෙ ගුණ    සිහිවන්නේ
ලොව්තුරු බුදුගුණයයි    සිහිවන්නේ
දකුණකුධාතුව පෙළහර    දෙන්නේ
ථූපාරාමය මම    නමදින්නේ

සෑ බඳ වට කප්‍රුක    දිලිසෙනවා
පූජාවට අපි කොඩි ගෙන    එනවා
ජීවමාන බුදු රුවක්    මැවෙනවා
ථූපාරාමෙන් රැස්    විහිදෙනවා

තෙල් මල් සුවඳින් දසතම පුරවා
සෑ මළුවේ පිංසිත මම වැඩුවා
දුක් කරදර සැම දුරුවී යේවා
සතුට සමාදානය ඉතිරේවා

ථූපාරාමය අපි නමදින්නයි
පවුලේ දියුණුව නිති සැලසෙන්නයි
නවග්‍රහ අපලින් අප මුදවන්නයි
අඹු දරුවන් සැම දෙවියො රකින්නයි

සැමදෙන එක්වී කළ මහ පිංකම
පෙර බුදුවරු වැඩ සිටි මේ පිංබිම
දෙනෝ දහක් දෙන වඳිනා පිංබිම
සාදු අපිත් නමදිමු මේ පිංබිම

ථූපාරාමෙන් රැස් විහිදේවා
උතුම් සෑය නිති දෙවියො රකීවා
කළ පිංකම මතු සිහියට ඒවා
එපිනෙන් නිවනට මග සෑදේවා

# ථූපාරාම වන්දනා ගාථා

යස්මිං දක්ඛිණමක්ඛකඤ්ච මුනිනෝ පත්තප්පමාණංතනු
ධාතුඤ්චාපි නිධාය ලෝක මහිතො ජබ්බණ්ණසෝභාකුලං
දේවානම්පියතිස්ස භූපතිවරෝ කාරේසි සද්ධාධනෝ
ථූපාරාමවරං නමාමි තමහං අජ්ඣායිතං සත්ථුනා

**සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ දක්ෂිණ අකු ධාතුන් වහන්සේද, පාත්‍රයක් පමණ වු අස්ථි ධාතුන් වහන්සේලාද තැම්පත් කොට දේවානම්පියතිස්ස රජු විසින් කරවු ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේට මම බැතියෙන් වන්දනා කරමි.**

පත්තපමාණං මුණිරාජ ධාතුයො
නිධාය ධාතුංපිච දකඛිණ කඛං
දෙවාදි තිසෙසන කතංහි ථූපා
රාමාහිදානං පනමාමි භත්‍යා

**දකුණු අකුධාතුව හා පාත්‍රයක් පමණ සර්වඥධාතුද පිහිටුවා දෙවන පෑතිස් මහරජතුමා විසින් කරවන ලද උතුම් ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!**